**අපි වෙනුවෙන් අපි අරමුදල - 2013**

**-----------------------------------------**

අපි වෙනුවෙන් අපි අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ආයෝජන ලේඛනය යනාදියෙන් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2008 අංක 06 දරන අපි වෙනුවෙන් අපි අරමුදල් පනතේ 11(7) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගණකාධිකරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 -1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

------------------

### 2.1 මතය

-------

මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට අපි වෙනුවෙන් අපි අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 3. මූල්‍ය සමාලෝචනය

-------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂය සඳහා මෙහෙයුම් වලින් ජනනය වූ මූල්‍ය ප්‍රතිඵලය රු.67,561,567 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.31,995,802 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.35,565,765 ක වර්ධනයක් නිරීක්ෂණය විය.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

---------------------------------------

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.35,565,765 ක වර්ධනයක් සිදු වී තිබුණි. මේ තත්ත්වය සඳහා වියදම් හා ආදායම් අතර පහත සඳහන් විචලනයන් හේතු වී තිබුණි.

(අ) පරිත්‍යාග ආදායම රු.120,466,062 කින් හෙවත් සියයට 342 කින් වැඩිවීම.
(ආ) සම්ප්‍රේෂණ කුළුණු ගාස්තු ආදායම රු.40,754,527 කින් හෙවත් සියයට 36 කින් වැඩිවීම.
(ඇ) රණජයපුර නිවාස ව්‍යාපෘතියේ වාරික මුදල් ආදායම රු.3,164,346 කින් හෙවත් සියයට 45 කින් වැඩිවීම.
(ඈ) ආයෝජන පොළී ආදායම රු.14,483,785 කින් හෙවත් සියයට 18 කින් වැඩිවීම.
(ඉ) අත්පළඳනා වැඩසටහන යටතේ අත්පළඳනා විකුණුම් ආදායම රු.2,602,234 කින් හෙවත් සියයට 272 කින් වැඩිවීම.
(ඊ) ව්‍යාපෘති වියදම රු.144,847,955 කින් හෙවත් සියයට 54 කින් වැඩිවීම.
(උ) ක්ෂයවීම රු.1,059,288 කින් හෙවත් සියයට 5892 කින් වැඩිවීම.

## 4. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 4.1 කාර්ය සාධනය

------------------

2008 අංක 06 දරන " අපි වෙනුවෙන් අපි " අරමුදල පනතේ 4 වන ඡේදය ප්‍රකාරව සන්නද්ධ සේවාවල සාමාජිකයින්ට නිවාස ඉදිකිරීම පිණිස මූල්‍යමය සහාය ලබාදීම සඳහා යෝජනා ක්‍රම ඇති කිරීම, සුදුසුකම් ලබන සන්නද්ධ හමුදා සාමාජිකයන්ට නිවාස පහසුකම් ලබාගැනීම සඳහා ආධාර ලබාදීම, සන්නද්ධ සේවා සාමාජිකයන් විසින් මූල්‍ය ආයතන වලින් ණය ලබාගැනීම සඳහා සහ එම ණය ගෙවීම් සඳහා ආධාර ලබාදීම සඳහා විධිවිධාන සැලැස්වීම සහ සන්නද්ධ හමුදා සේවා සාමාජිකයකු මියයන අවස්ථාවේ දී හෝ සටනේ දී හෝ අනාථාකාරයකට ස්ථිරව ආබාධිතයකුවන අවස්ථාවක දී හෝ තුවාල සිදුවන අවස්ථාවක දී ණය ආපසු ගෙවනු ලැබීම සහතික කර ගැනීම සඳහා යෝජනා ක්‍රමයක් සකස් කිරීම අරමුදලේ ප්‍රධාන අරමුණු හා පරමාර්ථ විය.

කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය වන විට අරමුදල පිහිටුවා වර්ෂ 05 ක් ගත වී තිබූ නමුත් අරමුදලේ අවධානය යොදවා තිබුණේ ඉහත අරමුදල් වලින් සුදුසුකම් ලබන සන්නද්ධ හමුදා සාමාජිකයින්ට නිවාස පහසුකම් සැපයීම සඳහා ආධාර ලබාදීම සඳහා පමණි. අරමුදලේ සමස්ථ වත්කම් වලින් සියයට 90 ක් හෙවත් රු.821,046,485 ක් භාණ්ඩාගාර බිල්පත් සහ ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර ඇතත් අරමුදල් ආයෝජනය කිරීම් හැර ඉහත අරමුණු ඉටුකර ගැනීම සඳහා එම මුදල් යොදවා ගැනීම කෙරෙහි අවධානය යොමුවී නොතිබුණි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රාජ්‍ය ආරක්ෂක ඇමතිතුමා විසින් 2009 ජනවාරි 23 දින අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන ලද අංක එම්ඕඩී/එෆ්ඩී/අයිඒ/5/3/(2) දරන අමාත්‍ය මණ්ඩල සංදේශය සම්බන්ධයෙන් 2009 පෙබරවාරි 03 දින එළැඹි අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව බාහිර මාර්ග වලින් ලැබෙන සියළුම ලැබීම් ඒකාබද්ධ අරමුදලට ‘ බැර ’ කිරීමට කටයුතු කළ යුතු බවත්, එලෙස ඒකාබද්ධ අරමුදලට බැර කරන මුළු ආදායම ම “ අපි වෙනුවෙන් අපි ” අරමුදල සඳහා ප්‍රධානයක් ලෙස ලබාදීමට කටයුතු කළ යුතු බවත් රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් විසින් ත්‍රිවිධ හමුදාව, පොලිස් දෙපාර්තමේන්තුව සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව යන ආයතනවලට අංක එෆ්ඩී/අයිඒ/05/03(2) සහ 2009 නොවැම්බර් 11 දිනැති ලිපිය මඟින් දන්වා තිබුණ ද සමාලෝචිත වර්ෂය දක්වා කිසිදු වර්ෂයක බාහිර මාර්ග වලින් උපයනු ලබන ආදායම් ඒකාබද්ධ අරමුදල හරහා “අපි වෙනුවෙන් අපි ” අරමුදලට ප්‍රධානයක් ලෙස ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ඉපලෝගම රණජයපුර නිවාස ව්‍යාපෘතියෙන් නිවාස ලබාදෙනු ලබන ත්‍රිවිධ හමුදා සාමාජිකයින්ගෙන් නිවාසයක් සඳහා රු.800,000 ක මුදලක් රු.4,000 බැගින් මාසික වාරික 200 කින් ආපසු අයකරගත යුතු වුවද සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට රු.1,762,996 ක් වූ හිඟ වාරික මුදල් අයකර ගැනීමට අරමුදල අපොහොසත් වී තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

-------------------------------------------

## 5.1 සංයුක්ත සැලැස්ම

---------------------

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් අරමුදල විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළයුතු වුවත් එම සැලැස්ම 2013 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

## 5.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

---------------------------

සංයුක්ත සැලැස්මට අනුකූලව 2010 වර්ෂය සහ ඉන් ඉදිරියට වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම 2013 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි

## 5.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2002 සැප්තැම්බර් 12 දින හා 2004 පෙබරවාරි 20 දින දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ 402 හා 402(1) ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත අරමුදල විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව 2014 ඔක්තෝබර් 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 5.4 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2013 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින්වර අරමුදලේ ලේකම්වරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) ණය වාරික අයකර ගැනීම
(ආ) මුදල් ආයෝජනය කිරීම
(ඇ) සැලසුම් සකස් කිරීම